**රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල - 2015**

---

ශ්‍රී ලංකා රේගුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

------------------

2.1 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ පසුගිය කාල පරිච්ඡේදයට අදාල සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල සංරචකයක් ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකල යුතු වුවත් නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.547,799,236 ක් වූ ගෙවිය යුතු ශේෂයෙන් වැඩිපුර ගෙවා තිබූ එකතුව රු.240,232,487 ක් වූ ශේෂ අඩුකර ශුද්ධ ශේෂය වූ රු.307,566,745 ක් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ ණයගැති ශේෂ 04 ක් නිරවුල් කිරීම සඳහා ලැබී තිබුණු එකතුව රු.2,245,500 ක මුදලක් ණයගැති ගිණුම බැර කිරීම වෙනුවට ඉකුත් වර්ෂයේ අතිකාල ආදායම් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ ආදායම හා ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ඉහත වරද නිවැරදි කිරීම සඳහා රු.2,245,500 ක මුදලක් සදොස් ලෙස වර්ෂයේ ආදායමට හර කර ණයගැති ගිණුමට බැර කර තිබුණි. නැවත එම වරද නිවැරදි කිරීම සඳහා අදාල මුදල වර්ෂයේ ආදායමට හර කර ඉකුත් වර්ෂ ගැලපුම් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.4,491,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙතින් ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදලට අයකරනු ලබන මුදලින් සියයට 20 ක ප්‍රමාණයක් රජයට ගෙවිය යුතු අතර ඉතිරි සියයට 80 ක ප්‍රමාණය නිලධාරීන්ට ගෙවිය යුතු වේ. සමාලෝචිත වර්ෂයේ අවසානයට අරමුදලේ වගකීමක්ව පැවති රු.2,496,000 ක මුදලින් රජයට ගෙවිය යුතු ප්‍රමාණය හා නිලධාරීන්ට ගෙවිය යුතු ප්‍රමාණය වෙන වෙනම හඳුනාගෙන ගිණුම්ගත නොකර සම්පූර්ණ ප්‍රමාණයම අරමුදලේ වගකීමක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) නැව් බඩු පරීක්ෂණ කටයුතු සඳහා අදාල නාවික ප්‍රවාහන සමාගම් වලින් අයකරන මුදලින් සියයට 50 බැගින් ශ්‍රී ලංකා රජයට හා නැව් බඩු පරීක්ෂණ කටයුතුවල නිරතවන නිලධාරීන්ට ගෙවිය යුතු වේ. එහෙත් අදාල සමාගම්වලින් එකතු කරන සම්පූර්ණ මුදලින් රජයට ගෙවිය යුතු කොටස හා නිලධාරීන්ට ගෙවිය යුතු කොටස වෙන වෙනම හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට අයකළ සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වටිනාකමක් ලෙස ගිණුම්වල දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.307,566,745 ක් ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ අතිකාල වියදම ආදායම් ප්‍රකාශනය අනුව රු.565,111,555 ක් වුවද, උපලේඛනය අනුව එම වියදම රු.562,817,226 ක් වූයෙන් රු.2,294,329 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.186,037,730 ක් වූ ණයගැති ශේෂ 148 ක් අතරින් නියැදි පදනමක් මත තෝරාගත් එකතුව රු.170,870,160 ක් වූ ණයගැති ශේෂ 30 ක් සඳහා ශේෂ සනාථ ලිපි ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ආයතන 148 කින් අයවිය යුතුව පැවති ශේෂයන්ගේ එකතුව රු.186,037,730 ක් වූ අතර එම ණයගැතියන්ගෙන් සියයට 89 ක් හෙවත් එකතුව රු.166,201,633 ක් ප්‍රධාන ආයතන 13 කින් අරමුදලට අයවිය යුතුව පැවති ඒවා විය. එම ණය අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------

2007 ඔක්තෝබර් 20 දිනැති අංක 1520/17 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව රේගු අතිකාල අරමුදලට රැස්කරන මුදල්වලින් රේගු කාර්ය මණ්ඩලයට පමණක් ගෙවීම් කල හැකි වුවද අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහාද අතිකාල ගෙවීම් සිදුකර තිබුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලය නොලත් ගණුදෙනු**

---------------------------------------------

දීර්ඝ කාලයක සිට නිරවුල් නොවී පැවති එකතුව රු.7,017,198 ක් වූ ජංගම වත්කම් ශේෂ 04 ක් හා රු.125,087 ක් වූ ජංගම වගකීම් ශේෂයක් විධිමත් විමර්ශනයකින් සහ අනුමැතියකින් තොරව කපා හැර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.181,150,976 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.73,157,048 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.107,993,928 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අතිකාල ආදායම සියයට 20 කින් වැඩි වීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

නියමිත විධිවිධාන ප්‍රකාරව නිලධාරීන් විසින් සාමාන්‍ය රාජකාරී වේලාවන් වලින් පරිබාහිර වේලාවන්වලදී කරනු ලබන රාජකාරී වෙනුවෙන් සහ සාමාන්‍ය රාජකාරී ස්ථානවලින් බාහිර ස්ථාන වලදී ඉටුකරනු ලබන රාජකාරී වෙනුවෙන් විවිධ පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු හා අයකිරීම්ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට තාක්ෂණික සේවා සැපයීම වෙනුවෙන් එම ආයතනයෙන් අයකරනු ලබන ගාස්තුද අරමුදලට බැර කලයුතු වේ. එසේම එම අතිරේක රාජකාරී වෙනුවෙන් නිලධාරීන්ට කරනු ලබන ගෙවීම් මෙම අරමුදලේ වැය බරක් සේ සලකනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුල ඉහත සඳහන් පරිදි අතිකාල, නැව් බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු, වෙනුවෙන් පිළිවෙලින් රු.849,470,690 ක්, රු.308,184,006 ක් හා රු.14,976,000 ක් රැස්කර තිබූ අතර එම වැඩ කටයුතු සඳහා නිලධාරීන්ට පිළිවෙලින් රු.565,111,555 ක්, රු.154,092,003 ක් හා රු.11,980,800 ක් ගෙවා තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ කාර්යභාරයන්ට අදාලව නිකුත් කර තිබූ 2007 ඔක්තෝබර් 20 දිනැති අංක 1520/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 04 (අ) ඡේදය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගෙන්ද විමසා මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් වරින් වර තීරණය කරනු ලබන ගෙවීම් ප්‍රමාණවලට අනුකූලව අතිකාල ගෙවීම් සිදුකල යුතු වුවද, එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද 2013 වර්ෂයේදී එතෙක් ගෙවමින් පැවති අතිකාල දීමනා අනුපාතයන් දෙපාර්තමේන්තුවේ අතිකාල කමිටුව විසින් තවදුරටත් සියයට 45 කින් වැඩිකර ගෙවීම සඳහා ඉඩසලසා දී තිබුණද ඒ සඳහාද ඉහත ගැසට් පත්‍රය ප්‍රකාරව අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) අරමුදලින් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් වර්තමානයේ අතිකාල ගෙවීම් කිරීමේ දී පැය 24 ක නිවාඩු දිනයක් සඳහා පැය 27 ක අතිකාල ගෙවීමක්ද සාමාන්‍ය වැඩ කරන දිනයක් සඳහා පැය 18 ¾ දක්වා වූ අතිකාල ගෙවීමක් ද සිදු කරනු ලැබේ. එහෙත් ඒ සඳහා ගැසට් පත්‍රය ප්‍රකාරව අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 1967 සිට වර්ෂ 1973 දක්වා කාලපරිච්ඡේදය තුල ශ්‍රී ලංකා රේගුව විසින් සේවා සැපයූ ආයතන 75 කින් ලබාගෙන තිබූ රු.263,500 ක් වූ මූලික තැන්පතු මුදල ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබී තිබුණු පොලිය රු.12,023,151 ක් විය.

මෙම වටිනාකම ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙසද වාර්තා කර තිබුණද අදාල තැන්පතුවලට අදාල ආයතනයන්හි පැවැත්ම පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදුකර නොතිබූ අතර එම ශේෂ නිරවුල් කිරීමට විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ගුවන් සමාගම් 4 කින් ගුවන් වාර 755 ක් සඳහා බිල්පත් නිකුත් නොකිරීම නිසා ලැබිය යුතු එකතුව රු.2,274,000 ක් වූ ගුවන් සේවා ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද ශ්‍රී ලංකා රේගුව විසින් සේවා සපයනු ලබන ප්‍රධානම ගුවන් සමාගම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් බිල්පත් නිකුත් කර තිබුණේ 2016 මාර්තු වන අතර එම වටිනාකම රු.44,820,000 ක් විය. බිල්පත් නිකුත් කිරීමේ ප්‍රමාදයන් පිළිබඳව මීට පෙර විගණන විමසුම් මගින් පෙන්වා දී තිබුණද ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇතැම් නිලධාරීන් මාසයකට අදාල මුළු අතිකාල පැය ගණන ඉක්මවා අතිකාල සේවයේ නිරතවීම හා අතිකාල ලේඛනය අනුව වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අඛණ්ඩවම රාජකාරිවල නිරත වීම හා අතිකාල සේවයේ නිරත වීම අතාත්වික තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

(ආ) 2014 ජුලි 01 දිනැති අංක 478 දරන හා 2014 අගෝස්තු 20 දිනැති අංක 478 A දරන අභ්‍යන්තර චක්‍රලේඛ හා විධිවිධාන ප්‍රකාරව ඇතැම් අංශවල මාසික අතිකාල පැය සීමාව පිළිවෙලින් පැය 300 ක් හා පැය 400 ක් ලෙස දක්වා තිබුණද, එම සීමාවන් ඉක්මවමින් අතිකාල ගෙවා තිබුණු අවස්ථා විය.

(ඇ) ඇතැම් රේගු නිලධාරීන් වර්ෂය පුරා කිසිදු නිවාඩුවක් නොලබා අඛණ්ඩව රාජකාරිවල නිරත වී ඇති බවත් එම සෑම දිනකම ඉහත සඳහන් පරිදි අතිකාල දීමනා ලබාගෙන ඇති අවස්ථා පැවති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව එම නිලධාරීන් මාසයකට පැය 650 සිට පැය 680 දක්වා වූ පරාසයක් තුල අතිකාල හිමිකම් ලබාගෙන තිබූ අතර විගණනයේදී එය අසාමාන්‍ය තත්වයක් බව නිරීක්ෂණය විය.

**4.4 දෘශ්‍ය අක්‍රමිකතා**

-------------------

අතිකාල සේවයේ යෙදවීම හා ගෙවීම සම්බන්ධව ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ඉතාම දුර්වල මට්ටමක පැවති අතර එම නිසා අතිකාල ලේඛනයේ අත්සන් කළ පමණින් අතිකාල හිමිකම් ලබාගැනීමට නිලධාරීන්ට අවස්ථාව සැලසී ඇති බව නිරීක්ෂණය විය. මෙම අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණන විමසුම් හා විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණද තත්ත්වය විධිමත් කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

සිදු කල විගණන නියැදි පරීක්ෂාවේදී ශ්‍රී ලංකා රේගුවේ විදේශ වැඩමුළුවලට සහභාගී වූ නිලධාරීන් තිදෙනෙකු සඳහා එම විදේශ ගතවූ කාලපරිච්ඡේදය තුලදී . රු.13,807 ක් අතිකාල දීමනා ගෙවා තිබුණි. මෙසේ මූල්‍ය වංචාවක් පෙන්නුම් කරන එවැනි ගෙවීම් අනුමත කිරීම, ගෙවීම් කිරීම වැනි කටයුතු කිසිදු පරීක්ෂණයකින් තොරව නොසැලකිලිමත්ව සිදු කරන බව තවදුරටත් තහවුරු විය.

**5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල්වල වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 මාර්තු 29 දිනදීය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය, ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දිනට පෙර අනුමත කර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සඳහා අනුමැතිය ලබාගෙන තිබුණේ 2015 ජුලි 10 දින එනම් මාස 09 ක කාල ප්‍රමාදයක් සහිතවය.

(ආ) රේගු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වාර්ෂික අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | ගුවන් සමාගම් වලින් ගුවන් සේවා ගාස්තු අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම. |
| (ආ) අතිකාල ගෙවීම් පාලනය | අතිකාල ගෙවීම් සඳහා නියමිත අනුමැතීන් ලබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොවීම. |